# පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ශිෂ්‍ය සමවයස් කණ්ඩායම්වල චර්යාරටාවන් පිළිබඳ අධ්‍යයනයක්

හඳගිරියේ සිරිසුමන හිමි[1], ඉඹුලමුරේ විමලරතන හිමි[2]

## හැඳින්වීම

සියවස් ගණනාවක් තුළරාශිභූත වූ දැනුම අනාගත පරපුර වෙත සම්ප්‍රේෂණය කිරීමපාසල මඟින් සිදුකරනු ලබයි. එහිදී පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී එයට සම්බන්ධවන ප්‍රධාන පාර්ශ්වකරුවන් දෙදෙනා වන්නේ ගුරුවරයා හා ශිෂ්‍යයායි. ප්‍රතිපත්ති සම්පාදකයින් හා අධ්‍යාපනඥයින් විසින් ඉහළ සිට සකස්කරනු ලබන විෂය මාලාව ශිෂ්‍යයා වෙත ලබාදෙනු ලබන්නේ පංතිකාමරය තුළදී ය.මෙම ක්‍රියාවලියේදී ශිෂ්‍යයාට වැදගත් ස්ථානයක් හිමි වේ. එහෙයින් ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විමසීම වැදගත්ය. නවයොවුන් සිසුහු වැඩි වශයෙන් කණ්ඩායම් ගතව ක්‍රියාත්මක වීමට කැමැත්තක් දක්වති. එම සමවයස් කණ්ඩායම් වල පුමිතිරිබව අනුව යම්යම් විවිධතා පවති.එමෙන්ම පෞද්ගලික පාසල්වල පවතින සාමාජීය පරිසරයේ ක්‍රියාකාරීත්වය ද සමවයස් කණ්ඩායම්වල චර්යාවන් කෙරෙහි මෙන් ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි ධනාත්මකව මෙන්ම ඍණාත්මකව ද බලපෑම් කරනු ලබයි. පංතිකාමරය තුළ සිදුවන ඍණාත්මක චර්යාවන් අධිකවීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අසාර්ථක වීමට හේතුවේ. පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත ගුරුවරු විසින් මෙන්ම අධ්‍යාපනඥයින් විසින් ද ශිෂ්‍ය සමවයස් කණ්ඩායම්වල ස්වභාවය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ඔවුන්ගේ වෙනස්කම් හඳුනාගනිමින් කටයුතු කිරීමට අවශ්‍යය. ඉන් වඩා ඵලදායී ඉගෙනුම්-ඉගැන්වීම් වතාවරණයක් ඇතිකළ හැක.

## ගැටලුව

ශ්‍රී ලංකාවේ පෞද්ගලික පාසල්වල පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගැහැණු හා පිරිමි වශයෙන් ශිෂ්‍ය සමවයස් කණ්ඩායම්වල චර්යාරටාවන් පවත්වන්නේ කෙසේද? යන්න මෙම පර්යේෂණයෙහි ගැටලුව වේ.

[1] ආධුනික කථිකාචාර්ය, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, sirisumana96@yahoo.com

[2] rev.wimalarathana@gmail.com

අරමුණු

පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළශිෂ්‍ය සමවයස් කණ්ඩායම් චර්යාරටාවන් පිළිබඳව විමසීමේදී සමවයස් කණ්ඩායම් ස්ථාපිත වන්නේ කෙසේද යන්න සොයා බැලීම, පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සමවයස් කණ්ඩායම් ගොඩනගා ගන්නා චර්යා රටා විමසා බැලීම, පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගැහැණු හා පිරිමි සමවයස් කණ්ඩායම්වල චර්යාරටාවන්ගේ වෙනසක් තිබේදැයි සොයාබැලීම, පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සමවයස් කණ්ඩායම් චර්යා රටා වඩා විධිමත් කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ.

ක්‍රමවේදය

ඉහත අවශ්‍යතා සපුරාලමින් තෝරාගත් පෞද්ගලික පාසල් දෙකක(බාලක/බාලිකා) ශිෂ්‍ය සමවයස් කාණ්ඩ ස්ථාපිත වී ඇති ආකාරයත්, එසේ ස්ථාපිත වූ කණ්ඩායම්වල සිසුන්ගේ චර්යා රටාවන් පිළිබඳවත්, ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව එහිදී දක්වන චර්යාවන්හි සුවිශේෂී තත්ත්වයන් ද පිළිබඳ විමසුමක යෙදෙන මෙම පර්යේෂණ සඳහා ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමය නම්වූ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි.යින්විසින් (Yin:1984)ඒකල පිරිසැකසුම්ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය හා බහුවිධ පිරිසැකසුම් ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය වශයෙන් ක්‍රමවේද දෙකක් දක්වා ඇත. ඒකල පිරිසැකසුම් ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය නැවත නැවත පර්යේෂණයට බඳුන්කළ හැකි සමාන අවස්ථා දක්නට නොමැති අවස්ථාවන්හිදී භාවිත කරනු ලබයි. සාක්ෂ්‍ය උදෙසා බොහෝ ප්‍රභවයන් පවතින, තත්‍ය ජීවිත අවස්ථා සඳහා බහුවිධ පිරිසැකසුම්ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය භාවිත කරනු ලබයි. මෙම අධ්‍යයනයේදී තථ්‍ය ජීවන අවස්ථා පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි. ඒ සඳහා බොහෝ ප්‍රභවයන් ද පවතී. මේ හේතුවෙන් බහුවිධ ප්‍රත්‍යක්ෂ අධ්‍යයන පිරිසැකසුම් ක්‍රමවේදය පර්යේෂණය සඳහා යොදාගන්නා ලදි. එමෙන්ම සමාජ අන්තර්ක්‍රියා කරණය නම් වූ න්‍යායාත්මක පදනම මූලික කරගත් මෙම අධ්‍යයනය මඟින් කනිෂ්ඨ ද්විතීයික අංශයේ (9 ශ්‍රේණියේ) සිසුන් අතර අන්තර්ක්‍රියාකරණය තුළින් ඇතිවන චර්යා පිළිබඳව විමසා බලන ලදි. එහිදී ගුරුවරුන් 10 දෙනෙක් හා ශිෂ්‍යයන් 50 දෙනෙක් හා ශිෂ්‍යාවන් 50 දෙනෙක් මෙම අධ්‍යයනය සඳහා නියදිය වශයෙන් යොදාගන්නා ලදි.

**සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ සමස්තපෞද්ගලික පාසල් සංඛ්‍යාව 80 කි. ඉන් 36ක් ආධාර නොලබන පාසල් (Full private) වන අතර 44ක් අර්ධ රාජ්‍ය පාසල් වේ. (semi government) මේවා අතරින් මහනුවර දිස්ත්‍රික්කයේ ආධාර නොලබන පෞද්ගලික පාසල් 05ක් ඇත. මේ අනුව මෙකී අධ්‍යයනයෙහි නියැදිය ලෙස මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි බාලිකා හා බාලක පාසල් දෙකක් යොදා ගැනුණි.

පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සමවයස් කණ්ඩායම් ස්ථාපිත වී ඇති ආකාරය පිළිබඳ විමසීමක යෙදීම මෙම අධ්‍යයනයේ එක් අරමුණක් විය. මේ සඳහා මෙම පාසල් දෙකෙහිම 9 ශ්‍රේණියේ පංති දෙක බැගින් නිරීක්ෂණය කරන ලදි. නිරීක්ෂණය කරන ලද පංති කාමරයන්හි සිසුන් නිරන්තරයෙන් ම කණ්ඩායම්ගතව සිටින අයුරුනිරීක්‍ෂණය විය. සම්මුඛ සාකච්ඡා දත්ත ද විශ්ලේෂණය කර බැලීමේදී අනාවරණය කරගත හැකිවූයේ ඔවුහු විවිධ අරමුණු ඔස්සේ තම සමවයස් කණ්ඩායම් ස්ථාපිත කරගෙන ඇති ආකාරයයි. ඒ අනුව එක හා සමාන විෂයන් ඉගෙනීම නිසා ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්, පංති කාමරය තුළ අවිධිමත් ලෙස නායකත්වය ගැනීමට ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්, තාක්ෂණික සන්නිවේදන මාධ්‍ය භාවිතය නිසා ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්,එක හා සමාන ක්‍රීඩාවක නිරතවීම නිසා ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්,එක හා සමාන ප්‍රවාහන මාධ්‍ය භාවිතා කිරීම නිසා ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්, දෙමාපියන්ගේ මිත්‍රත්වය හේතුවෙන් ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්, ඉගෙනීමට දක්වන හැකියාව මත ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්,විවේක කාලය තුළ එකට එකතු වී කෑම ගැනීම නිසා ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්,දෙමාපියන්ගේ සමාජ ආර්ථික පසුබිම මත ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්,පාසලට පැමිණීමට නේවාසිකව සිටින ස්ථානය අනුව ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්,විෂය බාහිර පොත්පත් හුවමාරු කරගෙන කියවීම තුළ ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම්, එකම රූපවාහිනි සන්නිවේදන වැඩසටහන් නැරඹීම තුළින් ස්ථාපිත වූ සමවයස් කණ්ඩායම් වශයෙන් සමවයස් කණ්ඩායම් 12 ක් ස්ථාපනය වී ඇති අයුරු අනාවරණය විය.

මෙම අධ්‍යයනයේදී පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගැහැණු හා පිරිමි සමවයස් කණ්ඩායම්වල පවතින සමානතා හා අසමානතා පිළිබඳව විමසා බැලීම ද අරමුණක් විය. අධ්‍යයනය සඳහා යොදාගත් පර්යේෂණ උපකරණ වන නිරීක්‍ෂණය, ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා ලේඛනගත වාර්තාමගින් ලබාගත් දත්ත, ත්‍රිකෝණීකරණය කිරීමෙන් අනාවරණය වූ චර්යාරටාවන් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමේදී ගැහැණු හා පිරිමි සමවයස්

කණ්ඩායම්වල සමාන චර්යා රටා මෙන්ම අසමාන චර්යා රටා ඇති බවත් අනාවරණය විය.

විෂය බාහිර ග්‍රන්ථ පරිශීලනයේදී පිරිමි සමවයස් කණ්ඩායම් වීරකතා, රහස් පරීක්ෂක කතා හාහොල්මන් කතා කියවීමට ප්‍රියකරණ බවත්, ගැහැණු ළමුන්තමවයසේ ගැහැණු ළමයි ගැන ලියවුණු සුන්දර කතා හා සුරංගනා කතාවන් කියවීමට ප්‍රියකරණ බවත් අනාවරණය විය.එමෙන්ම ගැහැණු හා පිරිමි සමවයස් කණ්ඩායම් සිය කණ්ඩායමේ යහළුවන් කිසි අවස්ථාවක පාවා නොදීම හා යම් වරදකදීසාමූහිකව දඩුවම් විඳීමට ඉදිරිපත් වීමට යොමුවීමක් අනාවරණය විය.සමවයස් කණ්ඩායම්වල චර්යා රටා විමසීමේදී මොවුන් දෙපිරිසම ගුරුවරුන්ට විවිධ හේතු මුල්කරගෙන අන්වර්ථනාම පටබැඳීමක් අනාවරණය විය.ගැහැණු හා පිරිමි සමවයස් කණ්ඩායම්වල සමාන චර්යාරටා අතර සිය ශරීරයේ සිදුවන වෙනස්කම්ගැන කතාකිරීම දෙපිරිසේම දක්නට ලැබුණි.

ඉගෙනුම් දක්ෂතාව මත මධ්‍යස්ථ හා පසුගාමී චර්යා දක්වන පිරිමි ළමයි බොහෝවිට පංතිකාමරයෙහි ගුරුවරයාගේ ඉගැන්වීම් කටයුතුවලට බාධාකාරී ලෙස හැසිරෙති.ගැහැණු ළමුන්ගේ මෙබඳු චර්යාවන් දක්නට නොලැබුණි.විවේක කාලයේ දී පිරිමි ළමයි එකතුවී කණ්ඩායමේ සියලු දෙනාගේම කෑම එක ගොඩකට දමාගෙන ආහාර අනුභවකළ ද ගැහැණු ළමයිතනි තනිවම සිය ආහාරවේල භුක්තිවිඳින ආකාරයක් අනාවරණය විය. විදේශීය ටෙලිනාට්‍ය වල රඟපාන නළු නිළියන්ගේ පින්තූර එකතුවක් තබාගැනීම ගැහැණු ළමුන්ගේ පමණක් දැකිය හැකිවූ විශේෂ චර්යාවකි. පිරිමි ළමුන්ගේ පංතිකාමරවල කාලච්ඡේද මාරුවීමේදී ගුරුවරුන් නොමැති අවස්ථාවල දැඩි ඝෝෂාකාරී තත්ත්වයක් දක්නට ලැබුණි. නමුත් ගැහැණු ළමුන්ගේ පංතිකාමරවල එතරම් ඝෝෂාකාරී තත්ත්වයක් නොවුණි. පිරිමි සමවයස් කණ්ඩායම් තුළ පැවති සුවිශේෂී ලක්ෂණයකි, ජනප්‍රිය හා මිලෙන් අධික උසස් තත්ත්වයේ භාණ්ඩ, උපකරණ හා සේවාවන් භාවිත කිරීම. ගැහැණු ළමුන්ගේ එබඳු චර්යාවන් දක්නට නොලැබුණි. ගැහැණු සමවයස් කණ්ඩායම්වල පැවති තවත් ලක්ෂණයකි, තම මිතුරියන්ගේ රහස් තදින් ආරක්ෂාකිරීම හා තමාගේ සුවිශේෂී රහස් සිය කණ්ඩායම සමග බෙදාගැනීම. එහෙත් පිරිමි ළමයි රහස් අන් අය ඉදිරියේ පවසමින් විනෝද වීමක් අනාවරණය වුණි. ගැහැණු සමවයස් කණ්ඩායම්වල දැඩි සමීප සම්බන්ධතා පැවතුණි. පිරිමි සම වයස් කණ්ඩයම්වල මෙබඳු සමීප බැඳීම් දක්නට නොවුණි. පිරිමි ළමයි ක්‍රීඩාවලට වැඩි කැමැත්තක් දක්වති. ඉඩ ලද හැම අවස්ථාවකම විවිධ ක්‍රිඩා සිදුකරත්. එනමුත් ගැහැණු ළමුන් විවේක කාලය තුළ පවා සිය පංතිකාමරයට වී කතාබහ කරමින් සිනාසෙමින් සිටිනු

දක්නට ලැබුණි. පිරිමි ළමුන් සිය අදහස් විවෘතව ඉදිරිපත් කළ ද ගැහැණු ළමයි තමන්ගේ අදහස් විවෘතව ඉදිරිපත් නොකරති.

## නිගමන

මෙම අධ්‍යයනය සඳහා තෝරා ගත් නියදිය මගින් අනාවරණය වූයේ සමවයස් කණ්ඩායම් මෙහිදි ඔවුන්එක හා සමාන විෂයයන් ඉගෙනීම, පංති කාමරය තුළ අවිධිමත් ලෙස නායකත්වය ගැනීම, ආදී අරමුණක් හෝ චර්යාවක් සඳහා ස්ථාපිතව ඇති බවයි. ගැහැණු හා පිරිමි ලෙස විවිධ වු හැසිරීම් රටා තොරාගත් නියදිය තුළින් අනාවරණය වූ අතර, රහස් ආරක්ෂා කිරීමේදි පිරිමි ළමුන්ට වඩා ගැහැණු ළමුන් ඉහළ මට්ටමක සිටින බව තහවුරු විය. ක්‍රීඩා කිරීම සඳහා පිරිමි ළමුන්ගේ වැඩි යොමු වීමක් දක්නට ලැබුණ ද ගැහැණු ළමුන්ගේ යොමුවීම ඉතා අවම විය. තමන්ගේ පාසල පිළිබඳ තදාත්මීකරණයෙන් යුතුව කටයුතු කිරීම මෙම පාසල් දෙකෙහිම සිසුන්ගෙන් අණාවරණය විය. මේ අනුව ගැහැණු හා පිරිමි වශයෙන් චර්යාරටාවන්ගේ විවිධතා මෙන්ම සමානතා ද පවතින බව නිගමනය විය.

ප්‍රමුඛ පදඃ ශිෂ්‍ය සමවයස් කණ්ඩායම්, චර්යාරටා, පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය,පෞද්ගලික පාසල්

## ආශ්‍රිත ග්‍රන්ථ

අනුලාවතී, කේ.ජෙ.කේ. (1991). *අන්තර් ක්‍රියාකරණය සහ පාසල.* ශාස්ත්‍රපති නිබන්ධනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

අම්බැක්ක, සුසිලා කුමාරි ඊ.කේ.(1998). *පාසල් ක්‍රියාවලිය. පංතිකාමරයේ සිදුවන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්.* දර්ශනපති නිබන්ධනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

කාරියවසම්, ටී. (1995).*සාරධර්ම අධ්‍යාපනය,* අධ්‍යාපන සඟරාව. ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගමය. අධ්‍යාපන පීඨය. කොළම විශ්ව විද්‍යාලය.

ජයසූරිය, චන්ද්‍රා. (1990).*අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප.* කොළඹ විශ්ව විද්‍යාලය.

මලලසේකර,ජී.පී.(1987).*ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය.* සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. නො.217, කොළඹ 10ඃ ඕල්කෝට් මාවත.

ලේකම්ගේ ඩී, ඇම්බැක්ක, එස්.කේ. (2015).*පර්යේෂණ ක්‍රම විද්‍යා ප්‍රවේශය,* කොළඹඃ ඇස් .ගොඩගේ සහ සහෝදරයෝ.